**අයදුම්පත් කැඳවීම.**

**උපකුලපති තනතුර - ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.**

වරින් වර සංශෝධිත 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 34 (1) වගන්තිය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2023 අප්‍රියල් 10 දිනැතිව නිකුත් කරන ලද කොමිෂන් සභා චක්‍රලේඛ අංක 3/2023 හි සඳහන් ප්‍රතිපාදන ප්‍රකාරව ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව හි පාලක සභාව, ඉදිරි තුන් අවුරුදු කාල සීමාවක් සඳහා උපකුලපතිවරයෙකු තෝරා පත් කර ගැනීම සඳහා, අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති පුද්ගලයන්ට අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීමට ආරාධනා කරනු ලැබේ.

ඉහත කී 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව උපකුලපතිවරයා පූර්ණ කාල නිළධාරියෙකු වන අතර, ඔහු හෝ ඇය එහි ප්‍රධාන විධායක හා ප්‍රධාන ශාස්ත්‍රීය නිළධාරියා මෙන්ම විශ්වවිද්‍යාලයේ ගණන් දීමේ නිළධාරියා ද වන්නේ ය. ඔහු හෝ ඇය නිළ බලයෙන් පාලක සභාව සහ සනාතන සභාව යන සභා දෙකෙහිම සාමාජිකයෙක් හා සභාපතිවරයා ද වන්නේ ය.

ඉහත කී පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව උපකුලපතිවරයා ධූරයෙන් ඉල්ලා අස් වුවහොත් හෝ ධූරයෙන් වෙනයම් ආකාරයකින් ඉවත් කරනු ලැබුවහොත් මිස, තුන් අවුරුදු කාල සීමාවක් සඳහා හෝ, ඔහු හෝ ඇය තම හැට පස් වන වර්ෂය සම්පූර්ණ කරන තෙක් යන කරුණු දෙකෙන් පළමුව එළඹෙන කරුණ සම්පූර්ණ කරන තෙක් සිය ධූරය දරනු ලබයි.

අධ්‍යයන කටයුතු මෙහෙයවීම, කළමනාකරණ ප්‍රතිපත්ති මෙහෙය වීම සහ හඳුන්වා දීම, පාලක සභා තීරණ ක්‍රියාත්මක කිරීම මෙන්ම විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය පරිපාලන කටයුතු මෙහෙය වීම උපකුලපතිවරයාගේ වගකීම වේ. ශාස්ත්‍රීය නිපුණත්වය, විනිවිදභාවය, වගවීම, සාධාරණ කළමනාකරණය සහ ඵලදායී හා අපක්ෂපාති නායකත්ව මූලධර්ම ඔහු හෝ ඇය විසින් ආරක්ෂා කළ යුතුය.

තෝරා ගනු ලබන අපේක්ෂකයා උසස් අධ්‍යයන ජයග්‍රහණ පිළිබඳ වාර්තාවක් ප්‍රදර්ශනය කළ යුතු අතර ශක්තිමත් අධ්‍යයන පැතිකඩක් සහිත සහ තහවුරු කරන ලද නායකත්ව ගුණාංග සහිත උපායමාර්ගික දැක්මක් ඇති අයකු විය යුතුය. ඔහු හෝ ඇය විවිධ පාර්ශව සමඟ විෂයානුබද්ධ අන්තර්ක්‍රියා කිරීමට හැකියාවක් ඇති අන්තර්පුද්ගල කුසලතාහි නිපුණත්වය ඇති, ප්‍රතිපත්ති රාමු පිළිබඳ මනා අවබෝධයක් ඇති සහ තීරණ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට කැපවීමක් සහිත පුද්ගලයකු විය යුතුය. තව ද ආයතනික සහ පුළුල් අර්ථයෙන් විශ්වවිද්‍යාල ප්‍රජාවට සහ සමාජයට ස්වකීය දායකත්වය ලබා දීමට ඇති හැකියාව පිළිබිඹු කරමින් විශ්වවිද්‍යාලීය ආචාරධර්ම සහ මෙහෙවර පිළිබඳ තෝරා ගනු ලබන අපේක්ෂකයාට ගැඹුරු අවබෝධයක් තිබිය යුතුය. (අපේක්ෂිත අයදුම්කරුවන්ට වැඩි විස්තර සඳහා විශ්වවිද්‍යාල වෙබ් අඩවියට පිවිසෙන ලෙස ආරාධනා කෙරේ. https://gwu.ac.lk/ )

උපකුලපතිවරයා, විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්යය මණ්ඩල වැටුප් පරිමාණයේ ඉහළම වැටුප් තලයේ පිහිටුවීමට සුදුසුකම් ලබන අතර, මූලික වැටුපෙන් 15% ක සංග්‍රහ වියදම් දීමනාවක්, සහ අදාළ තනතුර සඳහා හිමි අනෙකුත් දීමනා හා වරප්‍රසාද සඳහා ද හිමිකම් ලබයි.

අයදුම්කරුවන් යොමු කරනු ලබන අයදුම්පත් සමඟ පහත ලේඛන අන්තර්ගත විය යුතුය.

i. අයදුම්කරුගේ උපන්දිනය ඇතුළුව සම්පූර්ණ කරන ලද ජීව දත්ත පත්‍රිකාව (අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු අතර අයදුම්පත් කැඳවන අවසාන දිනය වන විට වයස අවුරුදු 63 ට අඩු විය යුතුය.)
ii. අයදුම්කරු උපකුලපති තනතුරට තේරී පත් වුවහොත් ඉටු කිරීමට අපේක්ෂිත කර්තව්‍ය පිළිබඳ කෙටි විස්තරයක් සහ විශ්වවිද්‍යාලය සංවර්ධනය පිළිබඳ දැක්මක් සහිත ප්‍රකාශයක්.
iii. විශ්වවිද්‍යාලයේ වත්මන් උපකුලපතිවරයා, හෝ මීට පෙර විශ්වවිද්‍යාලයේ උපකුලපති තනතුර දැරූ අයකු අයදුම්කරුවකු වන්නේ නම්, ඔහුගේ හෝ ඇයගේ පළමු නිල කාලය තුළ විශ්වවිද්‍යාලය අත්පත් කරගන්නා ලද ජයග්‍රහණ පිළිබඳ වාර්තාවක් ඉහත (i) සහ (ii) ලේඛනවලට අමතරව ලබා දිය යුතුය.

iv. රාජ්‍ය සේවයේ, සංස්ථා සේවයේ, ව්‍යවස්ථාපිත ආයතනවල සේවයේ හෝ උසස් අධ්‍යාපන ආයතනවල සේවයේ නියුතු බාහිර අයදුම්කරුවන් තම අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී ඔහු හෝ ඇය තනතුරට තේරී පත් වුවහොත් අදාළ අයදුම්කරු සේවයෙන් නිදහස් කළ හැකි ද යන්න සඳහන් කළ සේවා යෝජකයගේ ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.

අයදුම්පත් ලේඛකාධිකාරී/පාලක සභාවේ ලේකම්, ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව, නුවර පාර, යක්කල, ශ්‍රී ලංකාව, යන ලිපිනයට 2025 පෙබරවාරි මස 20 වන දින ප.ව. 3.30 ට හෝ ඊට පෙර වැඩ කරන දිනකදී ලියාපදිංචි තැපෑලෙන් ලැබීමට හෝ ලේඛකාධිකාරී කාර්යාලයට අතින් ගෙනවිත් භාර දීමට, අවශ්‍ය කටයුතු සැලැස්විය යුතු ය. අයදුම්පත අඩංගු ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ “උපකුලපති තනතුර-GWUIM” ලෙස සටහන් කළ යුතුය.

මීට අමතරව, ඉහත සඳහන් ලේඛනවල මෘදු පිටපතක් පී.ඩී.එෆ්. ආකෘතියෙන් යුතුව regoffice@gwu.ac.lk යන විද්‍යුත් ලිපිනයට ඉහත සඳහන් කරන ලද දිනය හා වේලාවට පෙර යොමු කළ යුතුය.

අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනෙන් මාස දෙකක් ඇතුළත වැඩ කරන දිනයකදී විශේෂ පාලක සභා රැස්වීමක් කැඳවනු ලබන අතර අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සහ ඇගයීම් කටයුතු වෙනුවෙන් අදාළ පාලක සභා සැසි වාරය සඳහා කැඳවනු ලැබේ. සියළුම අයදුම්කරුවන්ට අවම වශයෙන් විනාඩි දහයක කාල සීමාවක් සඳහා කෙටි ඉදිරිපත් කිරීමක් කරන ලෙස ඉල්ලා සිටින අතර එකී ඉදිරිපත් කිරීම විනාඩි පහළොවක කාලය නොඉක්මවිය යුතුය. කෙසේ වුවද සුවිශේෂී අවස්ථාවක දී අයදුම්කරුට අදාළ විශේෂ පාලක සභා රැස්වීමට පෙනී සිටීමට පෞද්ගලික හැකියාවක් නොමැතිනම්, ඔහු හෝ ඇය ඒ පිළිබඳව පාලක සභාවේ ලේකම්වරයාට පූර්ව දැනුම්දීමකින් පසු මාර්ගගත මාධ්‍ය හරහා පෙනී සිටීමට අවස්ථාව සලසා දෙනු ලැබේ.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද 2023 අප්‍රියල් 10 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 03/2023 චක්‍රලේඛයෙහි ප්‍රතිපාදන ප්‍රකාරව උපකුලපතිවරයා තෝරා පත් කර ගැනීම සිදු කරනු ලැබේ. උපකුලපති තනතුරට පත් කිරීමේ කාර්යය පටිපාටිය පිළිබඳ වැඩිදුර විස්තර සඳහා කරුණාකර ඉහත සඳහන් කොමිෂන් සභා චක්‍රලේඛය බලන්න.

(https://www.ugc.ac.lk/index.php?option=com_content&view=article&id=2442%3Acommission-circular-no-032023-appointment-to-the-post-of-vice-chancellor&catid=190%3Acirculars-published-in-2023-012023-and-above&Itemid=20&lang=en(

ඉහත දක්වා ඇති අවසාන දිනය සහ වේලාවෙන් පසුව ලැබෙන අයදුම්පත් සලකා බලනු නොලැබේ.

බී.ඒ.එන්. ක්‍රිෂාන්ත
ලේඛකාධිකාරී සහ පාලක සභාවේ ලේකම්
ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව,
නුවර පාර, යක්කල, ශ්‍රී ලංකාව.
2025.01.19